# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2158/40 - 2020 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2020.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල සහ බලශක්ති අමාත්‍ය මහින්ද අමරවීර වන මම, ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත් කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

මහින්ද අමරවීර,
විදුලිබල සහ බලශක්ති අමාත්‍ය.

2020 ජනවාරි මස 14 වැනි දින.

**උපලේඛනය**

ශ්‍රී ලංකාද්වීපයේ දකුණු පළාතේ, ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බද්දෙගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 220A දරන ගණේගම නැගෙනහිර ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ, පිහිටි මිනින්දෝරු යූ. ජී. එන්. එම්. ජයවර්ධන විසින් පිළියෙල කරන ලද අංක 1131 දරන 2019.08.15 දිනැති සැලැස්මෙහි කැබලි අංක A,C සහ D ලෙස පෙන්නුම් කර ඇති, පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණයෙන් පිළිවෙලින් හෙක්ටයාර් 0.00627 (අක්කර 0, රූඩ් 0, පර්චස් 2.48), හෙක්ටයාර් 0.05582 (අක්කර 0, රූඩ් 0, පර්චස් 22.07), හෙක්ටයාර් 1.82105 (අක්කර 4, රූඩ් 2, පර්චස් 00) ක් වූ ඉඩම් වලට අයත් මායිම් පහත දැක්වෙන පරිදි වේ.

**1. කැබලි අංක A - ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.00627 (අක්කර 0, රූඩ් 0, පර්චස් 2.48) ක් වූ ඉඩම.**

*උතුරට* : මාර්ගය (ප්‍රා.ස.) සහ අංක 777 සැලැස්මෙහි කැබලි අංක 1
*නැගෙනහිරට* : අංක 777 සැලැස්මෙහි කැබලි අංක 1 සහ 2
*දකුණට* : මෙම සැලැස්මෙහි කැබලි අංක B (මාර්ගය) සහ කැබලි අංක C කොටස
*බටහිරට* : මෙම සැලැස්මෙහි කැබලි B (මාර්ගය) සහ මාර්ගය (ප්‍රා.ස.)

*හිමිකම් කියන අය* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව


1A - G 31828 — 27 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

**2. කැබලි අංක C - ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.05582 (අක්කර 0, රූඩ් 0, පර්චස් 22.07) ක් වූ ඉඩම.**

*උතුරට* : මෙම සැලැස්මෙහි කැබලි අංක A සහ B කොටස්
*නැගෙනහිරට* : මෙම සැලැස්මෙහි කැබලි අංක B කොටස
*දකුණට* : මෙම සැලැස්මෙහි කැබලි අංක C දරන කොටස සහ වල්පිට වත්ත ඉතිරි කොටස
*බටහිරට* : වල්පිට වත්ත ඉතිරි කොටස සහ මෙම සැලැස්මෙහි කැබලි අංක C දරන කොටස

*හිමිකම් කියන අය :* නමුනුකුල ප්ලාන්ටේෂන් සීමාසහිත පුද්ගලික සමාගම

**3. කැබලි අංක D - ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.82105 (අක්කර 4, රූඩ් 2, පර්චස් 00) ක් වූ ඉඩම.**

*උතුරට* : මෙම සැලැස්මෙහි කැබලි අංක C දරන කොටස
*නැගෙනහිරට* : වල්පිට වත්ත ඉතිරි කොටස සහ කොරුල්ලවිල
*දකුණට* : කොරුල්ලවිල
*බටහිරට* : වල්පිට වත්ත ඉතිරි කොටස

*හිමිකම් කියන අය :* නමුනුකුල ප්ලාන්ටේෂන් සීමාසහිත පුද්ගලික සමාගම

01 - 747

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.